නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

11 ශ්‍රේණිය | **නර්තනය** | **2.2.2 ඒකකය**

<u>කුඳාංත ගතදොං වට්ටම - නර්තන අංග ප්‍රදර්ශනය කරමු.</u>

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

01. මාත්‍රා 2 + 2 + 4 තාල රූපය හඳුන්වන්නේ ..... ලෙසිනි.

(1). සුළු මහ දෙතිත
(2). දෙසුළු මහ තුන්තිත
(3). දෙසුළු මහ දෙතිත
(4). සුළු මහ තුන්තිත

02. මාත්‍රා 2 + 2 + 4 තාල රූපය මාත්‍රා ..... තාල රූපය ලෙසින් ද තාල තැබිය හැකිය.

(1). 4 + 4 (2). 2 + 4 (3). 3 + 3 (4). 2 + 3

03. වට්ටමක් ආරම්භ වන්නේ, ...

(1). අඩව්වෙනි
(2). ආරම්භක මාත්‍රයෙනි
(3). කස්තිරමෙනි
(4). ආරම්භක පදයෙනි

04. උඩරට වට්ටමක දී හමු නොවන පදයකි, ...

(1). අඩව්ව (2). වට්ටම් පදය (3). කස්තිරම (4). සිරුමාරුව

05. ආරම්භක පදයට සමානාර්ථ පදයකි, ...

(1). වට්ටම් පිරීම (2). වට්ටම් හැරීම (3). වට්ටම් නැටීම (4). වට්ටම් රැකීම

(ලකුණු 2×5 = 10)

- **ගැළපෙන පද යොදා හිස්තැන් පුරවන්න.**

01. කුඳාංත ..... කුඳ ..... තරිකිට ..... තා.
02. තත් ..... තොං ..... තා.
03. තාම් ..... ගත ..... කඩතක .....
කිතක ..... ගත ..... තක් ....
තාකු ..... ගත ..... තරිකිට ..... තා.
04. තත් ..... තක ..... තත් ..... තොං ..... තා.
05. ..... ගත දොං.

(ලකුණු 20)

- **පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

01. ඔබ දන්නා උඩරට නර්තන සම්ප්‍රදායේ වට්ටම් 2ක් නම් කරන්න. (ල.04)
02. තුන් තිතේ ප්‍රභේද අතුරින් 2ක් සඳහන් කරන්න. (ල.04)
03. වට්ටම්වල දී අඩව්වට පෙර නටන පද කොටස කුමක්ද? (ල.02)
04. ''කුඳාංත ගත දොං'' වට්ටමට අදාළ දෙවෙනි අඩව්ව ලියා දක්වන්න. (ල.10)